සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
# Third Term Test - Grade 08 - 2023

## බුද්ධ ධර්මය

කාලය පැය 02

නම / විභාග අංකය:

### I කොටස

● අංක 01-05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දළදා වහන්සේ ලක්දිවට වැඩම වීම පිළිබඳව පුරාවෘත්තය ලියවී ඇති පැරණිම ග්‍රන්ථය වන්නේ,
(i) දළදා පූජාවලිය (ii) පාළිදාඨාවංශය (iii) දළදා සිරිත (iv) දළදා වරුණ

02. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ එහි සාගතවාදීය, සඛීලය, සම්මෝදතය ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේගේ ''සුහද සීලී'' කථාබහ අගය කළේ,
(i) උදය බමුණාය
(ii) සුභද්‍ර පිරිවැජියාය
(iii) සකුළුදායි පිරිවැජියාය
(iv) සෝණදණ්ඩ බමුණාය

03. ''රාජගහ හා වළයම'' යන අරුත් හා බැඳුන අපේ බෞද්ධ චාරිත්‍රය වන්නේ,
(i) පිරිත් පිංකමයි
(ii) උපන් දින උත්සවයයි
(iii) විවාහ මංගල උත්සවයයි
(iv) අකුරු කියවීමයි

04. ''පෙකණිය නොදක්වා - සළු ඇඳ බොලට දක්වා'' යන පද්‍ය ඇතුළත් ග්‍රන්ථය නම්,
(i) සිරිත් මල් දමයි (ii) සුභාෂිතයයි (iii) කාව්‍ය ශේඛරයයි (iv) බුදුගුණ අලංකාරයයි

05. කායිකව සිදුවන අකුසල කර්මයක් නොවන්නේ,
(i) බොරුකීමයි (ii) සොරකම් කිරීමයි (iii) සතුන් මැරීමයි (iv) කාමයේ වරදවා හැසිරීමයි

● ප්‍රශ්න අංක 06-10 දක්වා දී ඇති ප්‍රශ්නවලටනිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරන්න.
(කාලසිලා, කාම තණ්හා, මියුළු, සම්මානතා, ආයුක්ඛය)

06. වේදේහ රජතුමා ............................................ නුවර රජකම් කළේය.

07. නිවසේ කටයුතුවලදී බිරිඳ කොන්කිරීමෙන් තොරව ඇයට නිසි ගෞරවයෙන් සැලකීම ............................................ නම් වේ.

08. ............................................ යනුවෙන් හැඳින්වෙන්නේ පස්කම් සැපයෙහි ඇලීම හෙවත් ඉඳුරන් පිනවීමේ ආශාවයි.

09. සත්ත්වයාගේ ආයුෂ ගෙවීයාම නිසා මරණයට පත්වීම ............................................ මරණ නම් වේ.

10. මුගලන් මහරහතන් වහන්සේ ............................................ ප්‍රදේශයට වැඩමවා පිරිනිවන්පා වදාළ සේක.

● ප්‍රශ්න අංක 11-15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (✕) ලකුණද වරහන තුළ යොදන්න.

11. වප් පොහෝදා රාත්‍රියේ පහන් පූජා කරන ප්‍රදීපෝත්සවය කාර්තික මංගල්‍යයයි. ( )

12. සුදුසු ප්‍රදේශයක වාසය කිරීම මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණකි. ( )

13. විනය පිටකය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාමේ වගකීම පැවරුනේ උපාලි තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවටයි. ( )

14. දළදාවහන්සේ මෙරටට වැඩම කරවීමට පුරෝගාමී වූයේ සාලිය කුමරු හා අශෝකමාලා කුමරියයි. ( )

15. බුදුරජාණන්වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කරන ලද්දේ මකුට බන්ධන නම් ස්ථානයේදීය. ( )

● ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල **A** තීරුවේ දී ඇති ප්‍රකාශයට ගැලපෙන පිළිතුර **B** තීරුවෙන් තෝරා අදාල ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

| | **A** | | | **B** |
|---|---|---|---|---|
| 16. | සප්ත අපරිහාණීය ධර්ම | ( ) | i. | පාපධර්ම |
| 17. | පිදිය යුත්තන් පිදීම | ( ) | ii. | වජ්ජි රාජ්‍යය |
| 18. | අකුසල කර්ම | ( ) | iii. | දුකට හේතුව |
| 19. | කළන්දක නිවාපය | ( ) | iv. | පූජාච පූජනීයානං |
| 20. | දුක්ඛ සමුදය ආර්ය සත්‍යය | ( ) | v. | මහා මොග්ගල්ලාන සූත්‍රය |

(ලකුණු 2×20=40)

# බුද්ධ ධර්මය - 8 ශ්‍රේණිය

## II කොටස

- **පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 2 බැගින් ප්‍රශ්න 10 ට ලකුණු 20 කි.**
- **ප්‍රශ්න අංක 2 සිට 6 දක්වා (i) කොටසට ලකුණු 2 ක්ද (ii) කොටසට ලකුණු 3 ක්ද (iii) කොටසට ලකුණු 5 ක්ද හිමි වේ.**
- **හත්වන ප්‍රශ්නයේ එක කොටසකට ලකුණු 5 බැගින් ලකුණු 10 කි.**

01. (i) බුදුරජාණන්වහන්සේ ගැටළු විසඳූ අවස්ථාවන්ගෙන් දෙකක් නම් කරන්න.

(ii) ''අසේවනාච බාලානං පණ්ඩිතානංච සේවනා'' යන මංගල කරුණු දෙක නම් කරන්න.

(iii) දිවා රෑ පින් වැඩෙන පින්කම් වලින් දෙකක් ලියන්න.

(iv) අනණ සූත්‍රයේ සඳහන් පරිදි ගිහියන් විසින් උපදවාගත යුතු සැප හතරෙන් දෙකක් ලියන්න.

(v) කයෙන් සිදුවන අකුසල කර්ම අතරින් දෙකක් ලියන්න.

(vi) ලොව පැවැත්මට හේතුවන ත්‍රිවිධ තෘෂ්ණාවෙන් දෙකක් නම් කරන්න.

(vii) ''කරන කලට පව් මිහිරිය මීසේ - විඳින කලට දුක් දැඩිවෙයි ගිණිසේ''යන කාව්‍ය ඇතුලත් උපදේශාත්මක ග්‍රන්ථය කුමක්ද?

(viii) දුක්ඛ ආර්ය සත්‍යයේ ඇතුළත් ''විපරිනාම දුක්ඛතා''යන්නෙහි සරළ අර්ථය ලියන්න.

(ix) ''විනය ශාසනයේ ආයුෂයයි'' මෙම තේරුම ඇතුළත් පාලි පාඨය ලියා දක්වන්න.

(x) සීලය යන්නෙහි අර්ථය සැකෙවින් දක්වන්න.

02. (i) බුදු සිරිතේ සඳහන්වන ආචාරශීලි ගුණාංග දෙකක් නම් කරන්න.

(ii) බුදුරජාණන්වහන්සේ මහජනමතයට ගරුකළ අවස්ථා තුනක් ලියන්න.

(iii) ශිෂ්‍යයෙකු ආචාරශීලිව කටයුතු කිරීමෙන් ඔහුගේ ජීවිතයට ලබාගතහැකි ප්‍රයෝජන පහක් සඳහන් කරන්න.

03. (i) ''යෝච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡාසෝ නප්පමජ්ජති'' යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථාවේ අර්ථය ලියන්න.

(iii) ඉහත ගාථාව ඇසුරින් ශිෂ්‍ය ජීවිතය ආලෝකමත් කර ගැනීමට ලබාගත හැකි ආදර්ශපාඨ පහක් ලියන්න.

04. (i) සදිසාවන් පිළිබඳව බුදුරජාණන්වහන්සේ දේශනා කරන ලද සූත්‍රය නම් කරන්න.

(ii) මිතුරන් ඇසුරු කිරීමේදී අනුගමනය කළයුතු පිළිවෙත් පහෙන් තුනක් ලියන්න.

(iii) යහපත් මිතුරන් ඇසුරු කිරීමෙන් ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගත හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

05. (i) වජ්ජී රජ දරුවන් අනුගමනය කළ බෞද්ධ පාලන ප්‍රතිපදාව කුමක්ද?

(ii) එම ප්‍රතිපදාවට අයත් කරුණු අතරින් තුනක් ලියන්න.

(iii) ආදර්ශමත් පංති කාමරයක් තුළින් සාර්ථක ඉගෙනුමකට මෙම ප්‍රතිපදාව උපයෝගී කරගන්නා ආකාරය පෙන්වා දෙන්න.

06. (i) බුදු දහමට අනුව කර්මය ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. එම කොටස් දෙක නම් කරන්න.

(ii) සිතින් සිදුවන අකුසල කර්ම තුන නම් කරන්න.

(iii) පුද්ගලයා විසින් සිදු කරන කුසලාකුසල කර්මවලට අනුව විපාක විඳීමට සිදුවේ. උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

- **පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.**

07. (i) මුගලන් මහරහතන්වහන්සේ

(ii) බුදුගුණ භාවනාව

(iii) සම්බුදු තෙමඟුල

(iv) ආගමික සහනසීලි බව